# <u>පළාත්, කලාප, කොට්ඨාස සහ පාසල් මට්ටමේ දත්ත නිලධාරීන් සඳහා වන අභිප්‍රේරණ වැඩසටහන</u>

## උපදෙස් සංග්‍රහය




**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**2024**

පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. හැඳින්වීම | 01 |
| 2. දත්ත නිලධාරී අභිප්‍රේරණ වැඩසටහනේ අරමුණු | 03 |
| 3. දත්ත නිලධාරී අභිප්‍රේරණ ක්‍රමවේදයන් | 03 |
| 4. වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව | 07 |
| 5. නියාමනය සහ ඇගයීම | 07 |

**1. හැඳින්වීම:**

අධ්‍යාපනයේ තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම සඳහා සෑම රටක්ම ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ඊට දායකවන්නන් සඳහා ගුණාත්මක සේවාවන් සැපයීම ද සිදු කරයි. එම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වන අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා සැලසුම්කරණ ක්‍රියාවලියේදී යාවත්කාලීන හා නිවැරදි අධ්‍යාපනික දත්ත මත පදනම්ව තීරණ ගැනීම සිදු කළ යුතු ය. මේ සඳහා නිවැරදි මෙන්ම යාවත්කාලීන දත්ත විධිමත්ව හා කඩිනම්ව ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාර්ගගත තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයන් මේ වන විටත් සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දී ඇත. උදාහරණ ලෙස වාර්ෂික පාසල් සංගණනය, ගුරු හවතුන් සඳහා වන ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය වැනි දෑ සැලකිය හැකිය. ඒ අනුව අදාළ මාර්ගගත දත්ත පද්ධතීන් වගකීමකින් යුතුව යාවත්කාලීන කිරීම සහ අධ්‍යාපනික දත්ත ජනනය වන පාසල් මට්ටමේ සිට ඉහළට දත්ත හා තොරතුරු ගලා ඒම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ජාතික මට්ටමින් හඳුන්වා දීම කාලීනව පැන නැගුණු අවශ්‍යතාවයක් විය. එම අවශ්‍යතාවය සපුරා ගැනීමේ මූලික පියවර ලෙස පාසල් මට්ටමින් එම කාර්යය සඳහා වෙන් වූ නිත්‍ය නිලධාරියකු නම් කිරීම අධ්‍යාපන ලේකම්ගේ 2022.11.15 දිනැති "පාසල් සඳහා දත්ත නිලධාරීන් නම් කිරීම" මැයෙන් යුතු ලිපිය අනුව සිදු කරන ලදී.

එමගින් දිවයිනේ සියලුම රජයේ පාසල්වලින් දත්ත කළමනාකරණ කාර්යය සඳහා එම පාසල්වලට ස්ථානගත කර ඇති සංවර්ධන නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරියකු හෝ වෙනත් අධ්‍යයන හෝ අනධ්‍යයන නිලධාරියෙකු පත් කර ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. තවද, ඊට සමගාමීව කොට්ඨාස, කලාප සහ පළාත් අධ්‍යාපන කාර්යාලවල සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී හෝ තොරතුරු තාක්ෂණ සේවාවලට අයත් කිසියම් හෝ නිලධාරියෙකු එම කටයුත්ත සඳහා නම් කිරීමට ද උපදෙස් ලබා දෙන ලදී. මෙසේ නම් කරන ලද පාසල්, කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ දත්ත නිලධාරීන්ගේ දායකත්වය අධ්‍යාපන පද්ධතියේ දත්ත සම්බන්ධ කටයුතු සඳහා ලබා ගැනීම මෙහිදී අපේක්ෂා කරන ලදී.

එසේ නම් කරන ලද නිලධාරීන් අනධ්‍යයන සිට අධ්‍යයන දක්වා වූ කාර්ය මණ්ඩලවල විවිධ තනතුරුවල පැවතීම නිරීක්ෂණය විය. 2022 වර්ෂයේ දී නම් කර ගන්නා ලද නිලධාරීන්ගේ සාරාංශගත තොරතුරු පහත පරිදි වේ.

| | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගුරු | 5441 |
| 02 | සංවර්ධන නිලධාරී | 4639 |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහායක | 96 |
| 04 | කළමනාකරණ සේවා නිලධාරීන්, පුස්තකාල සහායක, පාසල් කම්කරු, පාසල් මුරකරු ඇතුළු අනෙකුත් අනධ්‍යයන කාර්යය මණ්ඩලය සහ වෙනත් නිලධාරීන් | 905 |

මෙම නිලධාරීන් පාසල් මට්ටමින් හා අධ්‍යාපනික ආයතන මට්ටමින් දත්ත කළමනාකරණ කාර්යය සඳහා නම් කරගෙන ඇති අතර ඔවුන්ගේ ප්‍රමුඛ රාජකාරියට අමතර කාර්යයක් ලෙස මෙම ක්‍රියාවලියේ නිරත වේ. ඔවුන් අධ්‍යාපනික දත්ත කළමනාකරණය කාර්යය සඳහා දිශානුගත කිරීමට ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් ඔස්සේ මූලික පරිගණක පුහුණු පාඨමාලාවක් හැදෑරීමට අවස්ථාව ලබා දෙන ලදී. එම මූලික පාඨමාලාව සාර්ථකව නිමකරන ලද පාඨමාලාලාභීන් සඳහා ස්වයංක්‍රීයව ජනනය වන, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සහතික කරන ලද ඉ-සහතික පත්‍රයක් ලබා ගැනීමට ද අවස්ථාව උදාකර දී ඇත. මෙහි විශේෂත්වය වන්නේ වරින් වර අධ්‍යාපන පද්ධතිය තුළ දත්ත නිලධාරීන් වෙනස්වීමේ දී අලුතින් මෙම කාර්යය හා සම්බන්ධ වන දත්ත නිලධාරීන් විධිමත්ව නම් කිරීම මෙන්ම ඔවුන් සඳහා පුහුණු පාඨමාලාව ලබා ගැනීම සඳහා ඔවුන් ලියාපදිංචි කිරීම සහ නම් කරන ලද කාර්යය සඳහා දිශානුගත කිරීම ද විධිමත්ව සිදුවීමයි. මෙහිදී අදාල නිලධාරීන් මෙම මූලික පාඨමාලාව හැදෑරීම තුළින් අධ්‍යාපන පද්ධතිය තුළ අවශ්‍ය දත්ත හඳුනා ගැනීම, එක්රැස් කිරීම, නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම, විශ්ලේෂණය සහ අවශ්‍ය අවස්ථාවලදී ඉදිරිපත් කිරීම සිදුවේ.

ඒ අනුව, මේ වන විටත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල සක්‍රීයව රාජකාරියේ යෙදෙන දත්ත නිලධාරීන් හරහා සිදු වන ආයතනික මට්ටමේ දත්ත කළමනාකරණ ක්‍රියාවලියෙහි පහත මූලික සාධනීය ලක්ෂණ හඳුනාගත හැක.

01. පාසල් මට්ටමේ දත්ත සම්බන්ධයෙන් නිශ්චිත නිලධාරියෙක් නම් වී තිබීම නිසා ඒ සඳහා වගකිවයුතු හා දැනුමින් යුතු යාවත්කාලීන වූ නිලධාරියෙකුගේ සහය පාසල් පරිපාලනය වෙත ලැබීම.

02. දත්ත පිළිබඳ විමසීම සඳහා නිශ්චිත නිලධාරියෙකු කොට්ඨාස, කලාප හා පළාත් ආදී සෑම මට්ටමකම සිටීම.

03. වාර්ෂික පාසල් සංගණනය සාර්ථකව ක්‍රියාත්මක කිරීම.

04. පාසල් මට්ටමේ දෛනිකව අවශ්‍ය වන මූලික දත්ත යාවත්කාලීනව පවත්වා ගෙන යාම.

05. අධ්‍යාපනික දත්ත මත පදනම්ව තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට අවශ්‍ය සහය ලබා දීම.

06. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කර ඇති තොරතුරු පද්ධති සඳහා පාසල්, කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමින් දත්ත ඇතුළත් කිරීමට නිශ්චිත පුද්ගලයෙකු සිටීමෙන් එම පද්ධති යාවත්කාලීනව පවත්වාගෙන යා හැකි වීම.

මෙම පසුබිම තුළ ආරම්භයේ සිට මේ දක්වා මෙම ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදුවන නමුත් එලෙස කටයුතු කරන දත්ත නිලධාරීන් උපස්ථම්භනය කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස මේ වන විට හඳුනාගෙන ඇත. මෙම උපස්ථම්භනය මගින් එම නිලධාරීන් ස්වයං අභිප්‍රේරණයට ලක්කිරීම, ඔවුන් දත්ත හැසිරවීම සම්බන්ධ දැනුමින් සන්නද්ධ කිරීම හා එම දැනුම යාවත්කාලින කිරීම, සහ මෙම ක්‍රියාවලිය නිරවද්‍ය හා වඩා කාර්යක්ෂමව ඵලදායී අයුරින් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

**2. දත්ත නිලධාරී අභිප්‍රේරණ වැඩසටහනේ අරමුණු:**

- දත්ත නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කර ගැනීම.
- අධ්‍යාපන ක්‍රියාවලිය හා බද්ධවෙමින් දත්ත සම්බන්ධ ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සහ බල ගැන්වීම.
- කාර්යක්ෂම සේවාවක් සඳහා නිලධාරී අභිප්‍රේරණය කිරීම.
- පාසල් පද්ධතිය ඩිජිටල්කරණය මගින් බල ගැන්වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- වඩාත් ඵලදායී සේවාවක් සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ දත්ත මනාව හැසිරවීම. උපයෝජනය, විශ්ලේෂණය කිරීම, වාර්තා සකස් කිරීම.
- තොරතුරු පද්ධති යාවත්කාලීන නොවීමේ ගැටලුවට විසඳුමක් වීම.

**3. දත්ත නිලධාරී අභිප්‍රේරණ ක්‍රමවේදයන්:**

ඒ අනුව, දැනට අධ්‍යාපන පද්ධතිය තුළ සිටින දත්ත නිලධාරීන් උපස්ථම්භනය කිරීම සඳහා පහත ක්‍රමවේදයන් සහ වැඩසටහන් සැලසුම් කර ඇත.

I. දත්ත නිලධාරීන් සඳහා සකස් කර ඇති මූලික මාර්ගගත පාඨමාලාව හැදෑරීම සඳහා සියලු දත්ත නිලධාරීන් යොමු කිරීම.

කලාප මට්ටමින් ස්වයං මාර්ගගත ඉගෙනුම් පද්ධතිය සඳහා යොමු වීමට දැනුවත් කිරීම, දිරි ගැන්වීම, සහ කලාප හා පළාත් මට්ටමින් දත්ත නිලධාරීන් ඊට යොමු කිරීම.

II. දත්ත නිලධාරීන් සඳහා උසස් මාර්ගගත පාඨමාලාව හැදෑරීම සඳහා සියලු දත්ත නිලධාරීන් යොමු කිරීම.

මූලික පාඨමාලාව සම්පූර්ණ කල දත්ත නිලධාරීන්උසස් පාඨමාලාව සම්බන්ධව දැනුවත් කිරීම හා හැදෑරීමට අවස්ථාව ලබා දීම.

III. දත්ත නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා මාර්ගගත දත්ත පද්ධතිවලට (උදා: වාර්ෂික පාසල් සංගණනය) නිවැරදි හා යාවත්කාලීන දත්ත ඇතුලත් කිරීම මත පළාත්, කලාප, කොට්ඨාස සහ පාසල් මට්ටමේ නිලධාරීන් ඇගයීමට ලක් කිරීම සඳහා ප්‍රශංසා සහතික ලබා දීම:

A. <u>පළාත් මට්ටම</u>

පළාත් මට්ටමේ නිලධාරීන් සඳහා පහත නිර්ණායක මත අධ්‍යාපන ලේකම් මගින් ප්‍රශංසා සහතික ලබා දීම:

1. වාර්ෂික පාසල් සංගණනය සඳහා දත්ත ඇතුළත් කිරීමේ කාර්යක්ෂමතාවය - ලකුණු 10

අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන ශාඛාවෙන් ලබා ගන්නා තොරතුරු අනුව වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන ජාතික මට්ටමේ ස්ථානීය අනුපිළිවෙල මත පදනම්ව උපයාගන්නා ලකුණු:

| වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන ජාතික මට්ටමේ ස්ථානීය අනුපිලිවෙල | උපයාගත හැකි ලකුණු |
|---|---|
| 1 - 2 | 10 |
| 3 - 6 | 08 |
| 7 - 9 | 06 |

2. මූලික පාඨමාලාව සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
3. උසස් පාඨමාලාව සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
4. අධ්‍යාපන අමාත්‍යාංශ නිර්ණායක - ලකුණු 20

(මුළු ලකුණු 50)

**අවම ලකුණු 35 ක් උපයා ගන්නා පළාත් දත්ත නිලධාරීන් සඳහා ප්‍රශංසා සහතික නිකුත් කරනු ලැබේ.**

B. <u>කලාප මට්ටම</u>

කලාප මට්ටමේ නිලධාරීන් සඳහා පහත නිර්ණායක මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ප්‍රශංසා සහතික ලබා දීම:

1. වාර්ෂික පාසල් සංගණනය සඳහා දත්ත ඇතුළත් කිරීමේ කාර්යක්ෂමතාවය - උපරිමය ලකුණු 10

   අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන ශාඛාවෙන් ලබා ගන්නා තොරතුරු අනුව වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන ජාතික මට්ටමේ ස්ථානීය අනුපිළිවෙල මත පදනම්ව උපයාගන්නා ලකුණු:

| වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන කලාප අධ්‍යාපන කාර්යාලයන්හි ජාතික මට්ටමේ ස්ථානීය අනුපිලිවෙල | උපයාගත හැකි ලකුණු |
|---|---|
| 1 - 2 | 10 |
| 3 - 6 | 08 |
| 7 - 10 | 06 |

| | |
|---|---|
| 11-14 | 04 |
| 15 -18 | 02 |
| 19 - 20 | 01 |

2. මූලික පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
3. උසස් පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
4. පළාත් නිර්නායක - ලකුණු 20

   පළාතට සුවිශේෂී නිර්ණායක පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් සකසා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

   **අවම ලකුණු 35 ක් උපයා ගන්නා කලාප දත්ත නිලධාරීන් සඳහා ප්‍රශංසා සහතික නිකුත් කරනු ලැබේ.**

C. <u>කොට්ඨාස මට්ටම</u>

කොට්ඨාස මට්ටමේ නිලධාරීන් සඳහා පහත නිර්ණායක මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ප්‍රශංසා සහතික ලබා දීම:

1. වාර්ෂික පාසල් සංගණනය සඳහා දත්ත ඇතුළත් කිරීමේ කාර්යක්ෂමතාවය - උපරිමය ලකුණු 10

   අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන ශාඛාවෙන් ලබා ගන්නා තොරතුරු අනුව වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන ජාතික මට්ටමේ ස්ථානීය අනුපිළිවෙල මත පදනම්ව උපයාගන්නා ලකුණු:

| වාර්ෂික පාසල් සංගණනය නිවැරදිව නිම කරන කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයන්හි ජාතික මට්ටමේ ස්ථානීය අනුපිළිවෙල අංකය | උපයාගත හැකි ලකුණු |
|---|---|
| 1 - 5 | 10 |
| 6 - 10 | 08 |
| 11 - 15 | 06 |
| 16 - 20 | 04 |
| 21 -25 | 02 |
| 26 - 30 | 01 |

2. මූලික පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10

3. උසස් පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
4. පළාත් නිර්ණායක - ලකුණු 20

   පළාතට සුවිශේෂී නිර්ණායක පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් සකසා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

   **අවම ලකුණු 35 ක් උපයා ගන්නා කොට්ඨාශ දත්ත නිලධාරීන් සඳහා ප්‍රශංසා සහතික නිකුත් නිකුත් කරනු ලැබේ.**

   **වැදගත්:** උක්ත පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමේ දත්ත නිලධාරීන් ඇගයීමේ ක්‍රියාවලිය තුළම එම එක් එක් මට්ටමේ දත්ත කළමණාකරුවන් ද ඇගයීමට ලක් කරනු ඇත.

D. <u>පාසල් මට්ටම</u>

පාසල් මට්ටමේ දත්ත නිලධාරීන් සඳහා පහත නිර්ණායක පාදකව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ප්‍රශංසා සහතික ලබා දීම:

1. වාර්ෂික පාසල් සංගණනය සඳහා දත්ත ඇතුළත් කිරීමේ කාර්යක්ෂමතාවය - ලකුණු 10

   පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන ශාඛාවෙන් මේ සම්බන්ධ තොරතුරු ලබා ගත යුතුය. පාසල් මට්ටමේ සංගණන කටයුතු දත්ත නිලධාරියා විසින් සිදු කළ බවට විදුහල්පති මගින් සනාථ කර ගත යුතුය.
2. මූලික පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
3. උසස් පාඨමාලා සහතික පත්‍රය උපයා ගැනීම - ලකුණු 10
4. පළාත් නිර්ණායක - ලකුණු 20

   පළාතට සුවිශේෂී නිර්ණායක පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් සකසා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

   **අවමය ලකුණු 35 ට වැඩි පාසල් දත්ත නිලධාරීන් සඳහා ප්‍රශංසා සහතික නිකුත් කරනු ලැබේ.**

**සැ.යු:** මෙම ඇගයීම් ක්‍රියාවලියෙහි නිර්ණායක පිළිබඳ අවසාන තීරණය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වන අතර ඒ සම්බන්ධයෙන් සංශෝධන ඇතොත් පූර්වයෙන් අදාළ පාර්ශව දැනුවත් කිරීම් සිදු කරනු ඇත.

IV. දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම:

දේශීය පුහුණු අවස්ථා සැලසීම: පළාත් හා කලාප මට්ටමේ පුහුණු වැඩසටහන් මගින්

විදේශීය පුහුණු අවස්ථා සැලසීම: විධිමත් ක්‍රමවේද ඔස්සේ (මාර්ගගත/භෞතික) පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම.

V. අත්දැකීම් හුවමාරු වැඩසටහන් සකස් කිරීම.

VI. දත්ත නිලධාරී සංසද පිහිටුවීම.

**4. වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව:**

මෙම වැඩසටහන **2025 වර්ෂයේ ජනවාරි 01 දින සිට වාර්ෂිකව** ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. සෑම වසරකම පෙර වසරේ ක්‍රියාවලින් මත පදනම්ව ප්‍රශංසා සහතික ලබා දීම සඳහා ඇගයීම සිදු කරනු ඇත.

**5. නියාමනය සහ ඇගයීම:**

සමස්ත වැඩසටහන නියාමනය හා ඇගයීම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර ඒ සඳහා වන සම්බන්ධීකරණය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා සිදු කරනු ලැබේ. එසේම මෙම වැඩසටහන තුළ ඇගයීම් ක්‍රියාවලියෙහි තීරණ සම්බන්ධයෙන් වන අවසාන තීරණය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

**සම්පත්දායකත්වය**

01) එස්.ඩී. කස්තුරිආරච්චි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ, දත්ත කළමනාකරණ ශාඛාව හා තොරතුරු පද්ධති සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය, "ඉසුරුපාය", පැලවත්ත, බත්තරමුල්ල.

02) එච්.ඒ.එස්.පී. සේනාරත්න මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, දත්ත කළමනාකරණ ශාඛාව හා තොරතුරු පද්ධති සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය, "ඉසුරුපාය", පැලවත්ත, බත්තරමුල්ල.

03) ඒ.කේ.පී.එස්. කොඩිතුවක්කු මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත), දුම්රියපල පාර, මහනුවර.

04) කේ.එම්. ප්‍රභානි මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (දකුණු පළාත), අංක 19, ඉහල ඩික්සන් පාර, ගාල්ල.

05) එස්. එම්. පී. බණ්ඩාර මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (ඌව පළාත), වෙළගෙදර පාර, බදුල්ල.

06) එම්.ටී.එම්. අන්සෆ් මයා , සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සැළසුම් සහ දත්ත කළමනාකරණ), පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (සබරගමුව පළාත), ගැටන්ගම, රත්නපුර.

07) එස්. නිරූෂන් මයා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (උතුරු පළාත), සෙම්මනි පාර, යාපනය.

08) ඊ.එම්.ඒ.එස්. ඒකනායක මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (වයඹ පළාත), නුවර පාර, ගැට්ටුවාන, කුරුණෑගල.

09) එච්.එම්.ටී.එස්. හේරත් මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැළසුම්, පර්යේෂණ සහ දත්ත කළමනාකරණ), පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (උතුරු මැද පළාත), අනුරාධපුර.

10) බී.එම්.එස්.ඒ. බස්නායක මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැළසුම්), පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත), අංක 89, "රන්මගපාය",කඩුවෙල පාර, බත්තරමුල්ල.

11) එස්. තුෂ්‍යාන්තන් මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (නැගෙනහිර පළාත), අභ්‍යන්තර වරාය පාර, ත්‍රිකුණාමලය.